අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය
அத்தியாவசிய சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்
OFFICE OF THE COMMISSIONER GENERAL OF ESSENTIAL SERVICES

**2025-දෙසැම්බර්-02**
**File Number : 2025/04**

# මාධ්‍ය නිවේදනය

දිවයිනේ සියළුම ප්‍රදේශ වලට අඛන්ඩව LP ගෑස් ලබාදීම, ලිට්‍රෝ ගෑස් සමාගම විසින් තහවුරු කරමින් පවතී. ඒ අනුව සාමාන්‍ය දිනයකදී දිනකට සපයන ගෑස් සිලින්ඩර් 75,000 ක ප්‍රමාණය අද දින වන විට 91,000 දක්වා වැඩි කරමින් පෙර දිනවල පැවති අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු යොදා ඇත. කෙසේ වෙතත් තවදුරටත් බදුල්ල දිස්ත්‍රික්කයේ ,මහනුවර දිස්ත්‍රික්කයේ , කොළඹ දිස්ත්‍රික්කයේ සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශික 48කට බෙදා හැරීමේ මාර්ග අවහිරතා හේතුවෙන් ගෑස් බෙදාහැරීම සිදුකිරීමට නොහැකි වූ අතර එකී ප්‍රවේශ අවහිරතා පිළිසකර කිරීමත් සමඟම කඩිනමින් බෙදා හැරීමට කටයුතු යොදා ඇත.

බදුල්ල දිස්ත්‍රික්කයේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ ජල සම්පාදන මණ්ඩලයට යථාවත් කර ගැනීමට අපහසු තත්වයේ වූ ජල සම්පාදන ක්‍රම 5ක් මාර්ග සංවර්ධන අධිකාරියේ සහය ඇතිව පිළිසකර කිරීමට කටයුතු යොදන ලදි. දිවයින පුරා සමස්ථ ජල සම්පාදන ගෘහස්ථ සම්බන්ධතා 2,947,833 ක් අතුරින් තවදුරටත් 387,964ක් පිළිසකර කිරීම සඳහා පියවර ගැනෙමින් පවතින අතර, මහනුවර දිස්ත්‍රික්කයේ 66.8%, කෑගල්ල දිස්ත්‍රික්කයේ75.09% , කුරුණෑගල 41.34%, පුත්තලම දිස්ත්‍රික්කයේ 52.82% ක් ඒ අතර වේ.

දිවයිනේ දුරකථන සන්නිවේදන මාර්ග පිළිබඳව සිදු කරන ලද ආපදා තක්සේරුව මඟින් 20%ක දුරකථන සන්නිවේදන අවහිරතාවයක් පවතින බව හඳුනාගත් අතර මින් වැඩිම ප්‍රමාණය පුත්තලම දිස්ත්‍රික්කය සහ අම්පාර දිස්ත්‍රික්ක වල වේ. එම ප්‍රදේශ වල විදුලි සම්බන්ධතාවයන් නැවත පනගැන්වූ වහාම සාමාන්‍ය තත්වයට පත් කිරීමට කටයුතු යෙදේ. එමෙන්ම මින් ඉදිරියේදී සන්නිවේදන සම්ප්‍රේෂණය , විදුලිය බිඳ වැටීමකදී අඩාල නොවන ආකාරයට අදාල තාක්ෂණික විකල්පයන් වහා හඳුන්වා දිය යුතු බව හඳුනාගෙන ඇති අතර ඒ සඳහා පියවර ගැනීමට ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇත.

තවද ඊයේ දින වන විට ප්‍රවාහන කටයුතු සඳහා බාධා පැවති මාර්ග 256 අතුරින් 221ක් අද දින වන විට යථා තත්වයට පත්කොට ඇත.ඉතිරි ඒවාද කඩිනමින් යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

මීට අමතරව, තවදුරටත් ආහාරපාන සපයා ගැනීමට අසීරු, ගොඩබිම් ප්‍රවේශ අවහිර වී ඇති ස්ථාන වෙත ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහය ලබා ගනිමින් ආපදාවට ලක්වූවන්ට ආහාරපාන ලබා දීමට කටයුතු යොදා ඇත.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්

**Email Address:** cg@esgovsl.com ; cg@ocges.gov.lk
අංක 150, ආර්.ඒ. ද මැල් මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
எண். 150, ஆர்.ஏ. டி மல் மாவத்தை, கொழும்பு 03, இலங்கை
No. 150, R.A. De Mal Mawatha, Colombo 03, Sri Lanka